# නීතිඥ හර්ෂණ නානායක්කාර, පා.ම.
சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார, பா.உ.

**Harshana Nanayakkara, M.P.**

LL.B (Hons), Barrister of Lincoln's Inn
Attorney-at-Law

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය
நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்
Minister of Justice and National Integration


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | Moj/Media/press release / | |
| ඔබේ අංකය / உமது இல. / Your No. | | |
| දිනය / திகதி / Date | 2026.10.15 | |

**<u>එක්සත් ජාතික පක්ෂය විසින් 2026.10.14 දිනයේදී නිකුත්කල මාධ්‍ය නිවේදනය සම්බන්ධයෙනි.</u>**

එක්සත් ජාතික පක්ෂය විසින් ඊයේ (14) දින නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනය සම්බන්ධයෙන් මාගේ අවධානය යොමු වී ඇත. එම ප්‍රකාශයේ මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා උපුටා දක්වමින් භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ ආගමික නායකයින් බන්ධනාගාරයෙන් පිටතට රැගෙන යාමට අදාළ බන්ධනාගාර විධිවිධාන සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීම අවශ්‍ය නොවන කටයුත්තක් බවත්, දැනටමත් බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝගවල අනුගමනය කළ යුතු විධිවිධාන සියල්ලක්ම පැහැදිලිව සඳහන්ව ඇති බවත් ප්‍රකාශ කර ඇත.

නමුත් මෙම නිවේදනයේ හිතාමතාම උක්ත කරුණු තහවුරු කිරීම පිණිස බන්ධනාගාර නිත්‍ය නියෝග අංක 550 හි එක් කොටසක් පමණක් උපුටා දක්වා මහජනතාව නොමග යවන සුළු විකෘති අදහසක් ඉදිරිපත් කර තිබීම කණගාටුදායකය. සිරදඬුවම් විඳින භික්ෂූන් වහන්සේ නමකට අදාළ කරුණක් වැනි සමාජයට සංවේදී කරුණක් අරභයා මෙවැනි විකෘති සහගත අදහසක් සමාජගත කිරීමට වගකීම් සහගත දේශපාලන පක්ෂයක් කටයුතු කිරීම කණගාටුදායක තත්වයකි.

නීතිමය විධිවිධානයක එක් කොටසක් පමණක් පදනම් කර ගනිමින් කරුණු ඉදිරිපත් කිරීම තුළ වැරදි හෝ අසම්පූර්ණ අවබෝධයක් ඇති විය හැකි බව නීතිය පිළිබඳ අවම හෝ අවබෝධයක් සහිත අයෙකුට අවබෝධ විය යුතු කරුණකි.

එම මාධ්‍ය නිවේදනයේ නොමග යවන සුළු තත්ත්වයක් නිර්මාණය වන්නේ අදාළ නිත්‍ය නියෝගයේ සම්පූර්ණ අන්තර්ගතය ඉදිරිපත් නොකිරීම සහ ඥානසාර හිමියන්ට ලැබී ඇති සිරදඬුවමේ කාලසීමාව සැලකිල්ලට නොගනිමින් කරුණු ඉදිරිපත් කිරීමයි.

බන්ධනාගාර ආඥා පනතේ 550 වන වගන්තියේ මෙසේ සඳහන්ය:


අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 / இல. 19, ஸ்ரீ சங்கராஜ மாவத்தை, கொழும்பு 10 / No. 19, Sri Sangaraja Mawatha, Colombo 10.
Website : www.moj.gov.lk / Tel. : 011 2323022 | Fax : 011 2435294

"උසාවියට ඉදිරිපත් කළ යුතු වරදකරු කරනු ලැබූ සිරකරුවන් බන්ධනාගාර ඇඳුමින්ම උසාවියට ඉදිරිපත් නොකළ යුතුය. ඒ වෙනුවට වරදකරුවන් කරනු ලැබීමට පෙර ඔවුන් ඇඳීමට පුරුදුව සිටි ඇඳුමට ගැලපෙන සිවිල් ඇඳුමක් ඇඳීමට ඔවුන්ට ඉඩදිය යුතුය. අවුරුදු තුනක හෝ ඊට අඩු හෝ සිරදඬුවම් ලද සිරකරුවන් සම්බන්ධයෙන් කළ යුත්තේ ඔවුන්ගේ පෞද්ගලික ඇඳුම් ගබඩාවෙන් ගෙන ඇඳීමට දීමය. ඔවුන්ගේ පෞද්ගලික ඇඳුම්වලින් සිරකරුට ශිෂ්ටසම්පන්න පෙනුමක් නොලැබේ නම් මුදාලන විට සිරකරුවන්ට ආණ්ඩුවේ වියදමින් දෙනු ලබන රෙදිපිළිවලින් එම අඩුපාඩුව පිරවිය යුතුය. අවුරුදු තුනකට වැඩි සිරදඬුවම් ලද සිරකරුවන් සම්බන්ධයෙන් මුදාලන සිරකරුවන්ට දීමට නියම කොට ඇත්තාවූද බන්ධනාගාරයේදී අයත්වන වස්ත්‍ර වක්‍රයට ගැලපෙන්නාවූද ඇඳුම් ඇඳීමට සැලැස්විය යුතුය. මේ සඳහා අවශ්‍ය වන රෙදිපිළි 'ඒ'වක්‍රය හෝ 'බී'වක්‍රය යටතේ වර්ග කර තිබෙන සිරකරුවන්ට දීම සඳහා සිරකරුවන් මුදාලන විට දෙනු ලබන සම්පූර්ණ ඇඳුම් කට්ටල සෑහෙන ප්‍රමාණයක් සෑම බන්ධනාගාරයකම උපකරණ ගබඩාවේ සූදානමින් තැබිය යුතුය. එසේ නිකුත් කරනු ලබන රෙදිපිළිවල බන්ධනාගාර රෙදිපිළි වශයෙන් හඳුනා ගැනීමට කිසිදු සලකුණක් නොතිබිය යුතුය."

බන්ධනාගාර නිත්‍ය නියෝග 550 හි මූලික කරුණු 03ක් අන්තර්ගතය:

1. උසාවියකට ඉදිරිපත් කළ යුතු වරදකරු කරනු ලැබූ සිරකරුවන් බන්ධනාගාර ඇඳුමින්ම උසාවියකට ඉදිරිපත් නොකළ යුතුය.
2. අවුරුදු තුනක හෝ ඊට අඩු හෝ සිරදඬුවම් ලද සිරකරුවන් සම්බන්ධයෙන් ඔවුන්ගේ පෞද්ගලික ඇඳුම් ඇඳ පැළඳ බන්ධනාගාරයෙන් බැහැර විය හැකිය.
3. අවුරුදු තුනකට වඩා වැඩි සිරදඬුවම් ලැබූ සිරකරුවන් බන්ධනාගාරයෙන් බැහැර වන විට, මුදාලන සිරකරුවන්ට දීමට නියම කොට ඇත්තාවූ බන්ධනාගාර වස්ත්‍ර වක්‍රයට ගැලපෙන්නාවූ ඇඳුම් ඇඳීමට සැලැස්විය යුතුය.

ඒ අනුව ඥානසාර හිමියන්ගේ බන්ධනාගාරගත කිරීම වසර හයක කාලයක් වන බැවින් උන්වහන්සේගේ පෞද්ගලික ඇඳුමෙන් (සිවුරෙන්) අධිකරණයට ඉදිරිපත් කළ නොහැකි අතර, එයට අදාළ වන්නේ ඉහතින් සඳහන් කළ 550 වගන්තියේ තුන්වන කොටසයි. එම වගන්තියට අනුව ප්‍රකාශ කරන 'ඒ' හා 'බී' වස්ත්‍ර කාණ්ඩවලට භික්ෂූන් වහන්සේ විසින් අඳිනු ලබන චීවරය ඇතුළත් නොවේ.

ඒ අනුව භික්ෂූන් වහන්සේලා සමග රජය පැවැත්වූ සාකච්ඡාවලදී ඉදිරිපත් වූ යෝජනාව අනුව රැස්වූ විශේෂ කමිටුව නිත්‍ය නියෝග සංශෝධනය කර වසර තුනකට වැඩි සිරදඬුවමක් ලැබුණු භික්ෂුවකටද තම නිකායේ හෝ පර්ශ්වයේ අනුමැතිය පරිදි බන්ධනාගාරයෙන් බැහැරවීමේදී තම චීවරය පැළඳ බන්ධනාගාරයෙන් බැහැරවීමට අවස්ථාව ලබා දීම සඳහා නිර්දේශ කරනු ලැබ තිබේ. මෙම නිර්දේශයට අනුව අඳිනු ලබන වස්ත්‍ර කාණ්ඩයට එය ඇතුල් කිරීම මගින් බන්ධනාගාර නිත්‍ය නියෝගයන්ට අදාළව මෙතෙක් පැවති අඩුපාඩුව සම්පූර්ණ කිරීමට කටයුතු යොදා ඇත.

**නීතිඥ හර්ෂණ නානායක්කාර**
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය